**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-----------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 11 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ තාක්ෂණ සේවා නිලධාරී හා ආයුර්වේද වෛද්‍යවරයාගේ හිඟ වැටුප් ගෙවීමේදී 2013 වර්ෂයට අදාලව ගෙවන ලද වැටුප් හා වැන්දඹු අනත් දරු අරමුදල්වල එකතුව රු. 119,028 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර උක්ත නිලධාරීන් දෙදෙනා සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් ගෙවිය යුතු එකතුව රු. 137,219 ක වැටුප් හා වැන්දඹු අනත්දරු අරමුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාවට අයත් ගල් ක්‍රෂරය බදුගත් බදුකරුගෙන් සභාවට අයවිය යුතු රු. 443,996 ක බදු මුදල්, රු. 12,100 ක ප්‍රමාද දඩ මුදල්, රු. 2,420 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල් හා රු. 151,176 ක විදුලි බිල්පත් ගාස්තු වශයෙන් එකතුව රු. 609,692 ක මුදලකින් ගිණුම් ගතකර තිබුණේ රු. 336,475 ක් පමණි.

(ඇ) පරිත්‍යාග ලෙස විවිධ ආයතනයන්ගෙන් ලැබී තිබුණු වාහන 09 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර සභාවට අයත් රු. 652,000 ක් වටිනා මෝටර් රථයක් වෙනුවට කැබ් රථයක් හුවමාරු කර තිබුණද පැරණි රථය වත්කම් වලින් ඉවත්කර නව රථයේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේ වැඩ අවසන් කරන ලද රු. 3,930,280 ක් වූ උද්ධගන්දර කසළ අට්ටි ගැසීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් හා රු. 110,285 ක් වූ මහජන පුස්තකාල වැසිකිලිය ඉදිකිරීම් වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාවට අයත් ස්ථාවර තැන්පතුවක් වෙනුවෙන් 2013 ජූලි 02 සිට 2014 ජනවාරි 02 දක්වා වූ මාස 06 ක කාල පරිච්ඡේදය වෙනුවෙන් ලැබි තිබූ රු. 86,250 ක පොළී මුදල මෙම මුදල ගිණුම් ගතකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ දී තවත් ස්ථාවර තැන්පත් 02ක් සඳහා ලැබීතිබූ පොලී මුදලින් රු. 76,389 ක් 2013 වර්ෂයට අදාල වුවත් එම මුළු ආදායමම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,608,934 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 55,221 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 1,950 | 2,395 | 3,527 |
| ii. | බදුකුලී | 8,132 | 8,301 | 1,530 |
| iii. | බලපත්‍ර ගාස්තු | 8,012 | 10,196 | 782 |
| iv. | වෙනත් ආදායම් | 50,229 | 46,090 | 8,785 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ප්‍රමාණය වූ රු. 3,517,208 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදුකුලී

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාර පන්නෙගමුව හා දෙබරවැව සතිපොලවල් ටෙන්ඩර් කර බදු දීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) සභාවට අයත් කඩකාමර වලින් නිසි පරිදි කුලී මුදල් අයවී නොතිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකාමර කුලී මුදල රු. 1,472,794 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ගල් ක්‍රෂරය බදු දීම වෙනුවෙන් මාස 07 ක කාලසීමාවක් සඳහා බදුකරුගෙන් අයවිය යුතු මුළු මුදල රු. 443,996 ක් වූ අතර එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ඵලදායී ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

**2.2.4** **බලපත්‍ර ගාස්තු**

**---------------**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බලපත්‍ර ගාස්තු වල වටිනාකම වූ රු. 782,273 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.5** **වෙනත් ආදායම්**

**------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට දැන්වීම් පුවරු ගාස්තු , ගලි බවුසර් ආදායම් හා යන්ත්‍රෝපකරණ ආදායම් ලෙස එකතුව රු. 326,521 ක ආදායම් අයවීමට තිබුණි.

**2.2.6** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 6,800,678 ක මුදලක් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය

--------------------------------------

1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති 218 අනුව සභාවට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණය කළයුතු වුවත් එසේ සමීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණය

----------------------

2014 භාණ්ඩ සමීක්ෂණයෙන් පෙන්වාදී තිබූ භාණ්ඩ වර්ග 127 කට අදාල ඒකක 1357 ක ඌනතා සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 204 අනුව 2015 ජූලි 15 දින වන විටත් ක්‍රියාකර නොතිබුණි.

(ඇ) සේවක ණය
--------------

වර්තමානයේ සේවයේ නොසිටින සේවකයින් පස්දෙනෙකුගෙන් අයවිමට ඇති එකතුව රු. 105,030 ක හිඟ ණය ශේෂයක් අයකර ගැනීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) බහු කාර්යය ජංගම කුටි
---------------------------

පළාත් පාලන හා පළාත්සභා අමාත්‍යාංශයෙන් 2013 අයවැය යෝජනා මඟින් ක්‍රියාත්මක වූ පළාත් වල දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ රු. 270,000 ක් වටිනා කැනපි ආවරණ කුටි 10 ක් සභාවට ලැබී තිබූ අතර 2015 අප්‍රේල් 01 දින භෞතික පරීක්ෂාවේදී එම කුටි 07 ක් සභාවේ ආපදා කළමනාකරණ ඒකකයේ තිබූ අතර ඉතිරි කුටි 03 සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**3.2 මතභේදයට තුඩු දුන් ගනුදෙනු**
**-------------------------------**

i. පළාත් පාලන ආයතන වල සේවාවන් පුළුල් කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාව වෙත රු.1,310,856 ක් වටිනා කොඩිකණු (GI බට) 1184 ක් 2014 නොවැම්බර් 15 දින ලැබී තිබුණද එම කොඩිකණු ප්‍රමාණය ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණි.

ii. මෙම කොඩි කණු වලින් රු. 203,714 ක් වටිනා කොඩිකණු 184 ක් හම්බන්තොට ප්‍රාදේශීය සභාවටද රු. 115,142 ක් වටිනා කොඩිකණු 104 ක් අම්බලන්තොට ප්‍රාදේශිය සභාවටද නිකුත් කළබව දක්වා තිබුණද එම බට ප්‍රමානය එම සභාවන් වෙත ලැබි නොතිබුණි. හම්බන්තොට මහා නගර සභාව සඳහා රු. 141,714 ක් වටිනා කොඩිකණු 128 ක් නිකුත් කළ බව දක්වා තිබුණද එයින් රු. 66,428 ක් වටිනා කොඩිකණු 60 ක් හම්බන්තොට මහා නගර සභාව වෙත ලැබි නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය වත්කම්**
**-----------------**

රෙදි මහන උපකරණ කට්ටලයක්, මෝටර් බෝට්ටු දෙකක්, ශාරීරික ව්‍යායාම් උපකරණ කට්ටලයක් හා අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් නිෂ්පාදන යන්ත්‍රයක් යන වත්කම් දිර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර එම වත්කම් ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොන්ක්‍රීට් ගල් සහ ගල් කුඩු ප්‍රවාහනය

--------------------------------------------

2014 ජුලි 02 දිනැති අංක MPH/HYW/MNG/Cer/14-1 දරන මහාමාර්ග,වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ 1 ඡේදය අනුව මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමු ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී අමු ද්‍රව්‍ය මත එකතු කරනු ලබන 10% ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දක්වා තිබුණද 2014 ජුලි 02 දිනෙන් පසුව සභාව විසින් ගිවිසුම් අත්සන් කර ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 10 ක් වෙනුවෙන් එසේ කටයුතු නොකිරීම නිසා එකතුව රු. 59,150 ක මුදලක් වැඩිපුර බිල්කිරීම සිදුව තිබුණි.

(ආ) හැඩයම් වැඩ සඳහා වැඩිපුර ගෙවීම

--------------------------------------

මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 31 ක් සඳහා ගෙවීම් වාර්තා සකස් කිරීමේදී හැඩයම් වැඩ සඳහා ගෙවිය යුතු මුදලට වඩා වැඩිපුර මුදලක් ඇතුලත් කර තිබූ අතර ඒ හේතුවෙන් එකතුව රු. 242,767 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කර්මාන්ත භෞතික පරීක්ෂාව

---------------------------------

සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත කිහිපයක් සම්බන්ධයෙන් 2015 මාර්තු 31 හා අප්‍රේල් 02 දෙදින සිදු කල භෞතික පරීක්ෂාවේදී අනාවරනය වූ කරුණු පහත දැක්වේ.

අන්දරගස්යාය ක්‍රීඩා පිටිය අසල ඇල පාර සංවර්ධනය

------------------------------------------------------------

අන්දරගස්යාය ක්‍රීඩා පිටිය අසල ඇල පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තය රු.1,972,541 ක ගිවිසුම් ගත මුදලකට අනුමත සමිතියක් වෙත පවරා ඉටුකරවා ගෙන රු. 1,954,929 ක ගෙවීම් වාර්තාවක් සකස් කර ප්‍රතිපූර්ණය සඳහා යවා තිබුණි. මීටර් 187 ක් දිගට ඉදිකර තිබූ මෙම මාර්ගයේ අඟල් 4 ක් උසට ABC මිශ්‍රණය අතුරා ජලය ඉස මාර්ග තලනයක් මඟින් තලා ඝනවත් කිරීම වෙනුවෙන් රු. 280,921 ක මුදලක් ගෙවීම් වාර්තාවට ඇතුලත් කර තිබුණි. මෙම මාර්ගයේ මීටර් 30 න් 30 ට පමණ ස්ථාන 06 ක් පරීක්ෂා කල අතර එයින් එක් ස්ථානයක පමණක් ABC මිශ්‍රණය ස්වල්ප ප්‍රමාණයක් තිබූ අතර අනෙක් ස්ථාන පහේම ගල් කුඩු පමණක් මාර්ගයේ පතුලට යොදා තිබුණි. ඒ අනුව ගෙවීම් වාර්තාවේ දැක්වෙන ආකාරයට මාර්ගයේ පතුලට ABC මිශ්‍රණය යොදා නොමැති බව නිරීක්ෂණය විය.

(ii) මාර්ග වල ABC මිශ්‍රණය හා ගල්කුඩු නියමිත ප්‍රමාණයට යොදා නොතිබීම

------------------------------------------------------------------------------------------

කර්මාන්ත 11 ක් සඳහා මාර්ගයේ පතුලට අඟල් 4 ක් ඝනකමට ABC යොදා ජලය යොදා තැලීමෙන් අනතුරුව අඟල් 3 ක් පැවතිය යුතු ලෙස හා ABC තට්ටුව මතුපිට ගල් කුඩු අඟල් 2 ක තට්ටුවක් යොදා ඇති බවත් ගෙවීම් වාර්තාවේ දක්වා තිබුණි. ඒ අනුව ABC හා ගල්කුඩු තට්ටුවේ මුළු ඝනකම අඟල් 5 ක් විය යුතු වුවත් භෞතික පරීක්ෂාවේදී මෙම මාර්ග සඳහා යොදා තිබූ ABC මිශ්‍රණය හා ගල් කුඩු තට්ටුවේ සාමාන්‍ය ඝනකම අඟල් 3.25 – 4.29 දක්වා වූ පරාසයක විය.

(iii) තිස්සපුර 1 වන පටුමග 1 අදියර සංවර්ධණය

----------------------------------------------------

තිස්සපුර I වන පටුමග I අදියර සංවර්ධනය කිරීමේ කර්මාන්තය රු. 500,000 ක ගිවිසුම් ගත මුදලකට අනුමත සමිතියක් වෙත පවරා ඉටු කරවා ගෙන රු. 499,986 ක ගෙවීම් වාර්තාවක් සකස් කර ගෙවීම් කර තිබුණි. මීටර් 72 ක් දිගට මීටර් 3.0 පලළට හා අඟල් 02 ක් උසට මාර්ගයේ පතුලට ගල් කුඩු යෙදූ බව දක්වමින් ගල් කුඩු ඝණ මීටර් 10.8 ක් සඳහා රු. 26,643 ක මුදලක් ගෙවීම් කර තිබුණද මාර්ගයේ මීටර් 18 න් 18 ට පමණ ස්ථාන 4 ක් පරීක්ෂා කිරීමේදී අඟල් 02 ක් ඝණකමට ගල් කුඩු යොදා නොතිබූ බව නිරීක්ෂණය විය. ගල්කුඩු තට්ටුවේ සමාන්‍ය ඝනකම අඟල් 0.975 ක් බවත් ඒ අනුව ගල්කුඩු සඳහා ගෙවිය

යුතු මුදල රු. 11,650 ක් වුවද රු.26,643 ක් ගෙවීම නිසා රු. 14,993 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බවත් නිරීක්ෂණය විය.

(iv) මාර්ග උරහිස් නිසි පරිදි සකස් නොකිරිම
--------------------------------------------

i. කර්මාන්ත 04 ක් සඳහා මාර්ගයේ දෙපස මාර්ග උරහිස් සඳහා පස් සපයා ජලය යොදා තලා ඇති බව දක්වමින් එකතුව රු. 245,836 ක මුදලක් ගෙවීම් වාර්තාවට ඇතුලත් කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී, මාර්ග ඉදිකර අවසන් කර ඇති ස්ථානයට ආසන්නයෙන්ම ඉඩම් හිමියන්ගේ මායිම් වැටවල් පිහිටා තිබීම, මාර්ගයේ දෙපස කාණු සකස් කර තිබීම හා මාර්ගයේ දෙපස වෙල්යායවල් පිහිටා තිබීම යන කරුණු හේතුවෙන් මාර්ග උරහිස් සඳහා පස් යෙදීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් එසේ පස් යොදා නොමැති බවත් නිරීක්ෂණය විය.

ii. කර්මාන්ත 08 ක් සඳහා එකතුව රු. 498,246 ක මුදලක් මාර්ග උරහිස් සඳහා පස් සපයා ජලය යොදා තලා සනවත් කිරීම වෙනුවෙන් සන මීටර් 303.75 ක් සඳහා ගෙවීම් කර තිබුණද භෞතික පරීක්ෂාවේදී ගෙවීම් වාර්තාවේ සඳහන් කර තිබූ ප්‍රමාණයට පස් සපයා නොතිබූ බවත් සන මීටර් 129.68 ක ප්‍රමාණයක් පමණක් සපයා තිබූ බවත් නිරීක්ෂණය වූ අතර මෙම කිසිදු කර්මාන්තයක් සඳහා ජලය යොදා තැලීම සිදුකර නොතිබුණි.

(ඇ) කොන්ක්රීට් ගැටි නිසි පරිදි ඉදිකර නොතිබීම
-----------------------------------------------

කර්මාන්ත 07 ක් සඳහා මාර්ග වල දෙපස අඟල් 06 ක් පලළට හා අඟල් 09 ක් උසට කොන්ක්‍රීට් ගැටි ඉදිකර ඇති බව දක්වමින් ගෙවීම් වාර්තා සකස්කර තිබුණද භෞතික පරීක්ෂාවේදී එසේ කොන්ක්‍රීට් ගැටි ඉදිකර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව කොන්ක්‍රීට් ගැටි සඳහා රු.357,777 ක් වැඩිපුර ගෙවීම් වාර්තාවට ඇතුලත් කර තිබුණි.

(ඉ) නාමපුවරු සවිකර නොතිබීම
--------------------------------

ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 11 ක් සඳහා මි.මී. 600 x 900 ප්‍රමාණයේ නාම පුවරු 11 ක් සපයා සවිකර ඇති බව දක්වමින් එකකට රු. 6,000 බැගින් එකතුව රු. 66,000 ක මුදලක් ගෙවීම් වාර්තාවට ඇතුලත් කර තිබුනද භෞතික පරීක්ෂාවේදී නාමපුවරු සපයා සවිකර නොමැති බව නිරීක්ෂණය විය.

vi. කොන්ක්‍රීට් ගැටි සඳහා කම්බි යොදා වෙරගැන්වීම
------------------------------------------------------

මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් ගැටි සඳහා මී.මී. 10 ප්‍රමානයේ කම්බි යොදා ඇති බව දක්වමින් උඩුවිල මැද මාර්ගය සඳහා රු. 52,925 ක මුදලක්ද, මෝලකැපු පතාන පාසල් මාර්ගය වැව දක්වා සංවර්ධනය කිරිම සඳහා රු. 52,925 ක මුදලක්ද ගෙවීම් වාර්තාවට ඇතුලත් කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී උඩුවිල මැද මාර්ගයේ කොන්ක්‍රීට් ගැටි බැම්මේ එක් ස්ථානයක් පරීක්ෂා කළ අතර එම ස්ථානයේ කම්බි යොදා නොතිබූ බව තහවුරු විය. මෝලකැපූ පතාන පාසල් මාර්ගයේ වැව දක්වා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොන්ක්‍රීට් ගැටි බැම්මෙහි ස්ථාන 03 ක් පරීක්ෂා කළ අතර එයින් එක් ස්ථානයක කම්බි යොදා නොතිබූ බව නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලනය**
**------------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) සේවක ණය පරිපාලනය

(ඉ) වාහන නඩත්තුව හා පරිපාලනය